# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 දෙසැම්බර් මස 27 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.12.30 දින නිකුත් කරන ලදී)**


## විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (මින් මතුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) 99 වන ව්‍යවස්ථාවේ (6) වන ඡේදයේ (අ) උපඡේදයේ සඳහන් "මුළු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකකට අඩු ඡන්ද සංඛ්‍යාවක්" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට "මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අටෙන් එකකට අඩු ඡන්ද සංඛ්‍යාවක්" යන වචන ආදේශ කරමින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.